**තංගල්ල ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
----------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 04 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 26 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට තංගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
---------------------

පහත විස්තර දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ සැපයුම් හා උපකරණ සහ ප්‍රාග්ධන වියදම් එකතුව රු. 2,044,591 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොලිය රු. 80,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) i. ගොඩනැගිලි ඉදිකිරීම් සහ යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දරා තිබුණු එකතුව රු. 1,965,731 ක් වූ වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

ii. සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි අලුත්වැඩියාව සඳහා දරා තිබුණු රු.413,813 ක වියදම් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඈ) කර්මාන්ත ණයහිමියෝ සහ ණයගැතියෝ පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.

i. ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ සිදු කළ රු. 2,682,379 ක් වූ කර්මාන්තයක් සඳහා ණයගැති සහ ණයහිමි ප්‍රතිපාදන ඇති කර තිබුණි.

ii. 2014 වර්ෂයේ කර්මාන්ත 15 ක් හා 2016 වර්ෂයේ කර්මාන්ත 02 ක් වෙනුවෙන් රු. 1,478,160 ක් වැඩියෙන් ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි.

iii. සමාලෝචිත වර්ෂය අවසානයට සහා අරමුදලින් ඉවු කල කර්මාන්ත 04 ක් වෙනුවෙන් රු. 1,124,521 ක් අඩුවෙන් ණයහිමි ප්‍රතිපාදන ඇතිකර තිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

-------------------------

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ගිණුම් විෂයයන් 03 ක ශේෂ සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛන වල දැක්වෙන ශේෂ අතර නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු. 1,653,707 ක් විය.

**1.3.3 ලැබිය යුතු ගිණුම්**

-----------------

සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු. 142,284 ක් වූ හිඟ අක්කර බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

-----------------------------------

එකතුව රු. 101,871,295 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි, එකතුව රු. 79,381,293 ක් වූ මෝටර් රථ හා කරත්ත, එකතුව රු. 6,582,503 ක් වූ යන්ත්‍ර හා උපකරණ, එකතුව රු. 6,295,184 ක් වූ ලී බඩු හා සවි කිරීම් වලට අදාළ යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

----------------------------------------------------

පහත විස්තර දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම. |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශී සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| i. රීති 185 | ප්‍රාදේශීය සභා පොදු අරමුදල හා හුම්මාන ගිණුමේ පැවති පිළිවෙලින් රු. 18,321,533 ක හා රු. 2,934,602 ක අතිරික්ත මාසික සාමාන්‍ය මුදල් ශේෂ ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| ii. රීති 193 | අයවැයගත ප්‍රතිපාදන හා පරිපූරක සම්මත සමඟ සසඳා එක් එක් ආදායම් විෂයයන් හා වැය විෂයය යටතේ වන අතිරික්තයන් හෝ ඌනතාවයන් පිළිබඳ කරුණු පැහැදිලි කරන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 2016 වර්ෂයේදී සභාව සතු වාහන දහයක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 26,344,124 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 10,335,236 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 16,008,888 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 68 ක් තරම් ඉහළ අගයක පුනරාවර්තන වියදම් පැවති අතර, එය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවන බව නිරීක්ෂණ විය.

(ආ) 2015 හා 2016 වර්ෂ වලදී ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා සැලකිය යුතු අගයන්ගෙන් පුනරාවර්තන වියදම් දරා ඇති බවත්, ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් කිසිදු ආකාරයකින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති බවත් වියදම් පාලනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොමැති බවත් පෙන්නුම් කෙරුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය පිළිබඳ පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ ආදායම රු. 48,740,594 ක් වූ අතර, ඉන් රු. 23,061,611 ක් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 47 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබිය යුතු ආදායම් ශේෂවල එකතුව රු. 89,334,602 ක් වූ අතර ඉන් රු. 40,228,604 ක් අයවී තිබුණි. ඒ අනුව හිඟ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සියයට 45 ක් විය.

**2.3.2 වරිපනම් බදු**
**-------------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අයකළ හැකි දේපල හඳුනාගෙන තක්සේරු කර බදු අයකිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

**2.3.3 බදු කුලී**
**--------**

සභාවට අයත් රන්න ජී සහ යාය වත්ත පිහිටි කඩ කාමර තුනකින් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු හිඟ කඩ කාමර කුලී මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු. 1,118,305 ක හිඟ ශේෂයක් පැවතුණි. මෙම හිඟ කුලී මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.3.4 ව්‍යාපාර බදු**
**------------**

සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට අයවිය යුතු ව්‍යාපාර බදුවල එකතුව රු. 224,600 ක් වූ අතර, එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය අනුව ක්‍රියාකර නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**
**------------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු. 2,084,688 ක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 70,382,045 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**
**-------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**
**---------------------------------**

**3.1.1 දේපළ ණය පොලී ප්‍රතිපූර්ණය කර ගැනීම**
**--------------------------------------------**

2014, 2015 හා 2016 යන වර්ෂ වලට අදාළ එකතුව රු. 22,533 ක් වූ දේපළ ණය පොලී ප්‍රතිපූර්ණය කර ගැනීම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.1.2 වීථි පහන් නඩත්තුව**

**--------------------**

2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන වලට අනුකූලව, ලංකා විදුලිබල මණ්ඩලය වෙත අයදුම් කර විධිමත් කර නොගැනීම නිසා සභා අරමුදලින් නඩත්තු කරන වීථි පහන් 2300 න් වීථි පහන් 317 ක් සඳහා පමණක් ගාස්තු ප්‍රතිපූර්ණය කර තිබුණි.

**3.1.3 නිෂ්ක්‍රීය බැංකු ගිණුම්**

**------------------------**

2001 වර්ෂයේ සිට රු. 11,594 ක ශේෂයක් සහිත අක්‍රීය බැංකු ජංගම ගිණුමක් පැවතුණි.

**3.1.4 භාණ්ඩ සමීක්ෂණ**

**-------------------**

2007 අගෝස්තු 17 වන දින පලාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබූ රු. 150,000 ක් වටිනා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය, 2015 හා 2016 වර්ෂ වල භාණ්ඩ සමීක්ෂණ වලදී ඌන භාණ්ඩ ලෙස හඳුනාගෙන තිබූ නමුත්, මේ සම්බන්ධයෙන් 2017 ජූලි 31 දින වන විටත් ඉදිරි පියවරයන් ගෙන නොතිබුණි.

**3.1.5 පවරා නොගත් වත්කම්**

**--------------------------**

සභාව විසින් භාවිතයට යොදවා ගෙන ඇති වාහන 04 ක අයිතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවරාගෙන නොතිබුණි.

**3.2 නිෂ්ක්‍රීය වත්කම්**

**------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2006 වර්ෂයේ සභාවට ලැබී තිබූ උදළු තල 14 ක් කිසිදු ප්‍රයෝජනයකින් තොරව, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගබඩාවේ තබා තිබුණි.

(ආ) ආයතනය සතු වාහන දෙකක් වසර කීපයක සිට නිෂ්ක්‍රීයව පවතින නමුත්, එම වාහන අළුත්වැඩියාකර භාවිතයට යොදවා ගැනීමට හෝ විධිමත් ආකාරයට අපහරනය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) කිරිගල පිළිසරු ව්‍යාපෘති මාර්ගය කුට්ටිගල් අතුරා සැකසීම (තෙවන අදියර) රු. 1,987,153 ක මුදලකට 2015 නොවැම්බර් මස 24 දින ප්‍රදේශයේ ගොවි සංවිධානයකට පවරා වැඩ නිම කිරීමෙන් පසු රු. 1,790,377 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කර තිබුණි. මෙම ඉදිකිරීම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

i. ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 02 යටතේ මාර්ගයට පිටතින් බොරළු පස් ගෙනවිත් විසුරුවා හැර රෝලකින් සනවත් කිරීම සඳහා 63 $M^3$ වෙනුවෙන් රු. 55,374 ක් ගෙවා තිබුණද, එකී වැඩ විෂයය ඉටුකර තිබූ බව තහවුරු නොවුණි.

ii. ගෙවීම් වාර්තාව අනුව දිග මීටර් 280 ක වැඩ නිමකල බවට ගෙවීම් කර තිබුණද, භෞතික පරීක්ෂාව අනුව මාර්ගයේ ඉටු නොකල මීටර් 4.6 ක් වෙනුවෙන් රු. 32,784 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

iii. ඉදිකර තිබූ මාර්ගය මතුපිට පෙනුම දුර්වල තත්ත්වයක පැවති අතර, අතුරා තිබූ කුට්ටිගල් පහසුවෙන් කැඩිය හැකි ගල් වීම, මාර්ගයේ දෙපස කොන්ක්‍රීට් වැටි කුට්ටිගල් සමඟ මනා ලෙස බැඳී නොමැති වීම හා මාර්ගයේ බොහෝ ස්ථාන ගිලාබැස තිබීම නිසා මෙම කර්මාන්තය වෙනුවෙන් ගෙවන ලද මුදලට නිසි ඵලදායීතාවයක් ලැබී නොතිබුණි.

(ආ) සභා අරමුදල් යටතේ උක්ත කර්මාන්තයේ පළමු හා දෙවන අදියරයන් වෙනුවෙන් එකතුව රු 1,000,000 ක් වූ ඇස්තමේන්තු දෙකක් පිළියෙළ කර වැඩ ඉටු කරවා ගෙන තිබූ අතර, මිනුම් පරීක්ෂා කිරීමේදී ඉටු නොකළ වර්ග මීටර 47.12 ක් වෙනුවෙන් රු. 107,749 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 3.4 කාර්ය මණ්ඩල කළමනාකරණය

සභාවේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් තනතුරු 03 ක පුරප්පාඩු 04 ක් හා තනතුරු 07 ක අතිරික්ත 18 ක් පැවති බැවින් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.5 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) කසළ බැහැර කරන භූමිය වටා ආරක්ෂිත වැටක් ඉදිකර නොතිබුණු අතර, එම හේතුව නිසා කසළ අංගනයට ගවයන් හා අනෙකුත් සතුන් ඇතුළු වී තිබුණි.

(ආ) බැහැර කර තිබූ ප්ලාස්ටික්, වීදුරු, මැටි භාජන හා ටින් වලට ජලය රැස්වී තිබූ අතර, ඒතුලින් මැසි මදුරුවන් ඇතුළු රෝග කාරක කෘමීන් බෝවීමට ඉඩකඩ සැලසී තිබුණි.

(ඇ) රැස් කරන කසළ භාවිතයෙන් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම, ආරම්භ කර නොතිබුණු අතර, බැහැර කර තිබූ කසළ වලින් කොටසක් පමණක් පස් තට්ටුවකින් වසා තිබුණි. ඉතිරි කසළ පරිසරයට නිරාවරණව තිබීම නිසා අවට පරිසරයට හානි සිදු වී තිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 4.1 අයවැය පාලනය

වාර්ෂික අයවැය ලේඛනය මගින් වියදම් විෂයයන් 51 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 52,765,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබූ අතර, ආදායම් විෂයයන් 05 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 79,491,871 ක් විය. එම අගයන් සියයට 39 සිට සියයට 89 ක් දක්වා පරාසයක වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වාහන පාලනය
(ඈ) අයවැය පාලනය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය